# Australia’s සෞඛ්‍යය රැකවරණ ක්‍රමය Medicare වේ

Medicare මගින් සමහර සෞඛ්‍යය රැකවරණ සේවා සම්බන්ධ වියදම් පියවයි.

## Medicare ක්‍රියාත්මක වන ආකාරය

ඔබ හෝ ඔබ විසින් රැකබලා ගන්නා අයෙකු හට සෞඛ්‍යය රැකවරණ සේවා භාවිතා කිරීම හෝ බෙහෙත් මිලට ගැනීම සඳහා උපකාර කිරීම සඳහා ගෙවීම් සග සේවා ලබා දෙයි.

ඔබට සුදුසුකම් ඇතිනම්, පහත ආකාරයට Medicare මගින් උපකාර ලබාදෙයි:

- වෛද්‍යවරුන්, විශේෂඥයන්, දෘෂ්ඨි විශේෂඥයන්, සහ සමහර අවස්ථාවල දන්ත වෛද්‍යවරුන් සහ වෙනත් අනුමත කල වෘත්තිකයන් විසින් කරනු ලබන ප්‍රතිකාර සඳහා නොමිලේ හෝ ලාභයට ප්‍රතිකාර
- අඩු වියදම් බෙහෙත්
- රජයේ රෝහලක නොමිලේ ප්‍රතිකාර සහ ඉදුම් හිටුම්.

## Medicare සමඟ ලියාපදිංචි වන ආකාරය

පහත ආකාරයට Medicare සමඟ ලියාපදිංචි විය හැකිය:

- Medicare සමඟ ලියාපදිංචිවීමේ ආකෘතියක් පිරවීම මගින්
- ආකෘතිය සහ උපකාරක ලියවිලි **MES@servicesaustralia.gov.au** වෙත තැපැල් හෝ ඊමේල් කිරීම මගින්

ඔබගේ අවස්ථානුගත කරුණු අනුව අප වෙත උපකාරක ලියවිලි ලබාදිය යුතුය. ඔබගේ ලියවිලි පරිවර්තනය කිරීම අවශ්‍ය විය හැකිය.

ඔබ විසින් ලබාදිය යුතු ලියවිලි මොනවාද යන්න සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/enrolling-medicare** වෙත පිවිසෙන්න.

සමහර අය හට myGov ගිණුම ඔස්සේ මාර්ගස්ථවද ලියාපදිංචි විය හැකිය.

ඔබ පවුලක් වශයෙන් ලියාපදිංචි වන්නේ නම්, **servicesaustralia.gov.au/ms004** වෙත ගොස් ඔබ විසින් Medicare සඳහා ලියාපදිංචිවීමේ ආකෘතිය භාවිතා කල යුතුය.

Medicare Safety Nets හි කොටසක් වශයෙන් ඔබව තනි පුද්ගලයෙකු වශයෙන්ද අප විසින් ලියාපදිංචි කරනු ඇත. ඔබට අවශ්‍ය නම් ඔබ හට යුවලක් හෝ පවුලක් වශයෙන් ලියාපදිංචි විය හැකිය.

Medicare Safety Nets සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/safetynet** වෙත පිවිසෙන්න.

### Medicare සඳහා මාර්ගස්ථව ලියාපදිංචිවීම

පහත අවස්ථාවල myGov භාවිතා කර මාර්ගස්ථව ලියාපදිංචි විය හැකිය:

- Australia වේ පදිංචිවී සිටීම
- ඔබගේ වයස අවුරුදු 15 හෝ ඊට වඩා වැඩි නම්
- තනි පුද්ගලයෙකු වශයෙන් ලියාපදිංචි වන්නේ නම්.

පහත අවශ්‍යතා දෙකින් එකක් හෝ සම්පූර්ණ කල තිබිය යුතුය:

- ස්ථිර නේවාසික වීසා බලපත්‍රයකට අයදුම් කර තිබීම
- ස්ථිර නේවාසික වීසා බලපත්‍රයක් ප්‍රදානය කර තිබීම
- නැවත රටට පැමිණෙන නේවාසිකයකු වශයෙන් වීසා බලපත්‍රයක් දැරීම.

ඔබගේ myGov ගිණුම භාවිතා කර ඔබ Medicare සමඟ ලියාපදිංචි වන්නේ නම්, ඔබගේ අයදුම් පත්‍රයේ ප්‍රගතිය බලා ගත හැක.

ඔබගේ බැංකු ගිණුම් තොරතුරු එක් කරන ලෙස ඉල්ලා සිටින්නේ ඔබට Medicare ගෙවීම් සිදු කිරීම සඳහාය. බැංකු තොරතුරු සූදානමින් තබා ගන්න.

ඔබගේ අවස්ථානුගත කරුණු අනුව අප වෙත උපකාරක ලියවිලි ලබාදිය යුතුය ඔබගේ ලියවිලි පරිවර්තනය කිරීම අවශ්‍ය විය හැකිය. Services Australia බැංකු වෙබ් අඩවියේ ඔබට අවශ්‍ය වන ලියවිලි සම්බන්ධයෙන් කියවා ගන්න.

ඔබගේ අයදුම් පත්‍රය අනුමතවූ පසු, මීළඟ පියවර සම්බන්ධයෙන් අපි ඔබ සමඟ සම්බන්ධ වෙමු. ඔබ විසින් අපට ලබාදුන් ලිපිනය වෙත අපි Medicare කාඩ්පත තැපැලෙන් එවන්නෙමු.

ලියාපදිංචිවීම සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා **servicesaustralia.gov.au/enrolling-medicare** වෙත පිවිසෙන්න.

ඔබට අවශ්‍ය කටයුතු මාර්ගස්ථව කර ගැනීම සඳහා myGov ගිණුමක් ආරම්භ කර Medicare සමඟ එකතු කරන්න. වැඩිදුර විස්තර සඳහා, පිවිසෙන්න:

- **servicesaustralia.gov.au/mygovguides**
- **servicesaustralia.gov.au/medicarecard**

## Medicare කාඩ්පත

ඔබ ලියාපදිංචිවූ පසු ඔබට තැපැලෙන් Medicare කාඩ්පතක් ලැබෙනු ඇත. ඔබ ලබාදුන් ලිපිනයට අපි එය එවන්නෙමු. ඔබගේ Medicare කාඩ්පතේ ඩිජිටල් පිටපතක්ද ඔබට ලබාගත හැකිය. එය ලබා ගැනීම සඳහා Express Plus Medicare මෝබයිල් ඇප් එක වෙත ගොස් එයට පිවිසිය හැක.

Express Plus Medicare මෝබයිල් ඇප් එක, සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/expressplusmedicare** වෙත පිවිසෙන්න.

ඇප් එක භාවිතා කිරීම සඳහා, myGov මාර්ගස්ථ ගිණුම හා සම්බන්ධවුණු Medicare ගිණුමක් තිබිය යුතුය. ඔබට මේවා නැතිනම්, ආරම්භ කර ඇප් එක ඩවුන්ලෝඩ් කර ගන්න.

පහත දේ සඳහා ඔබට වලංගු Medicare කාඩ්පතක් අවශ්‍යවේ:

- Medicare ප්‍රතිලාභ අයදුම් කිරීමට
- බල්ක් බිල් කරන වෛද්‍යවරයෙකු හමුවීමට
- රජයේ රෝහලකදී පොදු රෝගියෙකු ලෙස ප්‍රතිකාර ලබා ගැනීමට
- සමහර බෙහෙත් අඩු මුදලට ලබා ගැනීමට.

ඔබ රජයේ හෝ පුද්ගලික රෝහලක පුද්ගලික රෝගියෙකු වශයෙන් ප්‍රතිකාර ගන්නා අවස්ථාවලදීද Medicare කාඩ්පත උපකාරවේ.

පවුලකට උපරිම වශයෙන් කාඩ්පත් 2ක් නිකුත් කල හැක. ඔබ වයස අවුරුදු 15 හෝ ඊට වැඩිනම්, ඔබගේම Medicare කාඩ්පතක් ලබා ගත හැකිය.

ඔබගේ Medicare කාඩ්පත නැතිවුවහොත් හෝ සොරා ගතහොත්, ඔබගේ Medicare මාර්ගස්ථ ගිණුම හෝ Express Plus Medicare මෝබයිල් ඇප් එක භාවිතා කර නව කාඩ්පතක් ලබාගත හැකිය.

ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/medicarecard** වෙත පිවිසෙන්න.

## ඔබගේ බැංකු ගිණුම් තොරතුරු ලියාපදිංචි කරන්න

ඔබගේ බැංකු ගිණුම් තොරතුරු අප සමඟ ලියාපදිංචි කරන්න, ඒ මගින් ඔබගේ Medicare ප්‍රතිලාභ කෙළින්ම ඔබගේ නම් කල බැංකු ගිණුම වෙත ගෙවිය හැකිය.

පහත දේ භාවිතා කර ඔබගේ බැංකු ගිණුම ලියාපදිංචි කරන්න:

- ඔබගේ myGov ගිණුම ඔස්සේ ඔබගේ මාර්ගස්ථ Medicare ගිණුම
- Express Plus Medicare මෝබයිල් ඇප් එක.

පහත දේ අවශ්‍යවේ:

- ඔබ ලියාපදිංචි වන විට Medicare කාඩ් සහ බැංකු ගිණුම සම්බන්ධ තොරතුරු (බී.එස්.බී., ගිණුම් අංකය සහ ගිණුමේ නම)
- ඔබගේ තොරතුරු වෙනස් වූයේ නම් අප වෙත දන්වන්න.

ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/medicareservices** වෙත පිවිසෙන්න.

## ඉල්ලීම් ඉදිරිපත් කිරීම

ඔබගේ Medicare කාඩ්පතේ දක්වා ඇති ඕනෑම අයෙකු වෙනුවෙන් සෞඛ්‍යය රැකවරණ සේවාවක් සම්බන්ධ ඉල්ලීමක් ඔබ විසින් කල හැක.

ඔබගේ වෛද්‍යවරයා ඉලෙක්ට්‍රොනිකව ඉල්ලීම් ඉදිරිපත් කරන්නේ නම්, ඔබගේ වෛද්‍යවරයාගේ කාර්ය මණ්ඩලය විසින් ඔබ වෙනුවෙන් ඉල්ලීම ඉදිරිපත් කල හැකිය. ඔබගේ වෛද්‍යවරයාගේ කාර්යාලය මගින් ඔබ වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කල නොහැකි නම්, පහත ආකාරයට ඔබ විසින් ඉල්ලීමක් ඉදිරිපත් කල හැකිය:

- ඔබගේ myGov ගිණුම ඔස්සේ ඔබගේ මාර්ගස්ථ Medicare ගිණුම භාවිතා කර
- Express Plus Medicare මෝබයිල් ඇප් එක භාවිතා කර
- සේවා මධ්‍යස්ථානයකින් පුද්ගලිකව
- Medicare Claim form (MS014) සම්පූර්ණ කර තැපැල් මගින්.

ඔබ විසින් වෙනත් Medicare කාඩ් පතක සිටින අයෙකු වෙනුවෙන් සේවාව සඳහා ගෙවා ඇතිනම්ද ඔබට අයදුම් කල හැක. මෙය ඔබට මාර්ගස්ථව කල නොහැක.

ඉල්ලීම් ඉදිරිපත් කිල හැකි විකල්ප සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/medicareclaiming** වෙත පිවිසෙන්න.

## Reciprocal Health Care Agreements (අන්‍යෝන්‍ය සෞඛ්‍යය රැකවරණ ගිවිසුම්)

ඔබ විදේශයකට ගියවිට Medicare මගින් ප්‍රතිකාර සඳහා ආවරණය නොකරයි. කෙසේ වුවද, ඕස්ට්‍රේලියානු රජය විසින් සමහර රටවල් සමඟ ඇතිකර ගෙන තිබෙන Reciprocal Health Care Agreements (RHCA) ගිවිසුම් අනුව ඕස්ට්‍රේලියානුවන් එම රටවල සංචාරය කරන අතරතුර අත්‍යාවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සම්බන්ධ වියදම් ආවරණය කරයි.

එම රටවලින් පැමිණෙන සංචාරකයන් හටද ඔවුන් Australia තුල සිටින අතරතුර සමහර සෞඛ්‍යය සේවා සහ අඩු ගණනට සමහර බෙහෙත් ලබාගත හැකිවේ.

RHCA සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/rhca** වෙත පිවිසෙන්න.

## Medicare ස්වයං සේවාව

අප සමඟ ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට කටයුතු කිරීම පහසුවේ. අප වෙත දුරකථනයකින් කථා නොකර සහ අප වෙත නොපැමිණ බොහෝ දේ කඩිනමින් සහ පහසුවෙන් කරගත හැක.

ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට, ඔබගේ පුද්ගලික සහ බැංකු විස්තර යාවත්කාලීන කිරීමට හෝ ස්ථාපන හෝ දෙවන Medicare කාඩ්පතක් සඳහා අයදුම් කිරීම සඳහා ඔබගේ Medicare මාර්ගස්ථ ගිණුම සහ Express Plus Medicare

මෝබයිල් ඇප් එක භාවිතා කරන්න. ඔබට එන්නත් ප්‍රකාශන සහ තව බොහෝ දේ බැලිය හැකිය.

## Medicare මාර්ගස්ථ ගිණුම

ඔබට myGov ඔස්සේ මාර්ගස්ථ Medicare ගිණුමක් ලියාපදිංචි කල හැකිය. ඔබට සුදුසු ඕනෑම අවස්ථාවක ඕනෑම ස්ථානයක සිට Medicare සමඟ කටයුතු කිරීමට එය ඔබට ලබාදුන් ආරක්ෂිත ක්‍රමයකි.

ලියාපදිංචි වන ආකාරය සම්බන්ධ ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/medicareonline** වෙත පිවිසෙන්න.

## Express Plus Medicare මෝබයිල් ඇප් එක

Express Plus Medicare මෝබයිල් ඇප් එක භාවිතා කරමින්ද ඔබට බොහෝ දේ කරගත හැක. ඔබට Medicare මාර්ගස්ථ ගිණුමක් ඇති විට, App Store, Google Play හෝ Windows Store වෙතින් ඇප් එක ඩවුන්ලෝඩ් කරගත හැක.

ඉංග්‍රීසියෙන් ඇප් එක සම්බන්ධ වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/expressplus** වෙත පිවිසෙන්න.

### වැඩි දුර විස්තර සඳහා

- ඉංග්‍රීසියෙන් වැඩි විස්තර සඳහා **servicesaustralia.gov.au/medicareservices** වෙත පිවිසෙන්න
- ඔබගේ භාෂාවෙන් තොරතුරු කියවීම, සවන් දීම සහ නැරඹීම සඳහා **servicesaustralia.gov.au/yourlanguage** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න
- Centrelink ගෙවීම් සහ සේවා සඳහා ඔබගේ භාෂාවෙන් කථා කිරීම සඳහා දුරකථන අංක **131 202** අමතන්න
- Medicare සඳහා **132 011** අමතන්න, Child Support සඳහා **131 272** අමතන්න. ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම් අප වෙත දන්වන්න, අප විසින් එය නොමිළේ පිළියෙල කරනු ඇත
- සේවා මධ්‍යස්ථානයක් වෙත පිවිසෙන්න.

සටහන: ඔබගේ නිවෙස් දුරකථනයෙන් Australia තුල ඕනෑම ස්ථානයකට '13' අංක ඇමතීම සඳහා ස්ථිර ගාස්තුවක් අය කරයි. එම ගාස්තුව ප්‍රදේශීය දුරකථන ඇමතුමේ සිට වෙනස් විය හැකි අතර දුරකථන සේවා සපයන්නා අනුවද වෙනස්වේ. ඔබගේ නිවෙස් දුරකථනයෙන් '1800' අංක වෙත ගනු ලබන දුරකථන ඇමතුම් සඳහා ගාස්තු අය නොකරයි. ප්‍රසිද්ධ ස්ථානවල ඇති සහ ජංගම දුරකථනවලින් ගනු ලබන ඇමතුම් කාලය අනුව වැඩි අනුපාතයකින් අය කරයි.

### බැහැරකිරීම්

මෙම ප්‍රකාශනයේ ඇතුලත් තොරතුරු, ගෙවීම් සහ සේවා සම්බන්ධ මාර්ගෝපදේශයක් පමණක් ලබා දීමට අරමුණු කරයි. ඔබගේ අවස්ථානුගත තත්වයන් යටතේ ගෙවීමක් ලබා ගැනීමට අයදුම් කිරීමට හෝ අයදුම් පත්‍රයක් යොමු කිරීමට තීරණය කිරීම ඔබගේ වගකීමවේ.

# Medicare is Australia’s health care system

Medicare helps cover the cost of some health care services.

## How Medicare works

We provide payments and services that can help when you or someone you care for use health care services or buy medicines.

If you are eligible, Medicare helps with:

- free or cheaper treatment by doctors, specialists, optometrists, and in some cases dentists and other approved health professionals
- low cost medicine
- free treatment and accommodation in a public hospital.

## How to enrol in Medicare

You can enrol in Medicare by:

- completing a Medicare enrolment form
- mailing or emailing the form and supporting documents to **MES@servicesaustralia.gov.au**

You will need to give us supporting documents depending on your circumstances. You may need to have your documents translated.

For more information in English about what documents you may need, go to **servicesaustralia.gov.au/enrolling-medicare**

Some people can also enrol online using their myGov account.

If you are enrolling as a family, you need to use the Medicare enrolment form, go to **servicesaustralia.gov.au/ms004**

We will also register you as an individual as part of Medicare Safety Nets. You can register as a couple or family if you need.

For more information in English about Medicare Safety Nets, go to **servicesaustralia.gov.au/safetynet**

### Enrolling in Medicare online

You can enrol online using myGov if you are:

- living in Australia
- 15 years or older
- enrolling as an individual.

You must also have either:

- applied for a permanent resident visa
- been granted a permanent residency
- hold a returning resident visa.

If you enrol in Medicare using your myGov account, you can track the progress of your application.

We will ask you to add your bank account details so we can pay you Medicare payments. Have your banking details ready.

You will need to give us supporting documents depending on your circumstances. You may need to have your documents translated. Read about the documents you need on the Services Australia website.

Once your application is approved, we will contact you with your next steps. We will also send your Medicare card in the mail to the address you gave us.

For more information about enrolling, go to **servicesaustralia.gov.au/enrolling-medicare**

To do your business with us online, create a myGov account and link to Medicare. To find outmore, go to:

- **servicesaustralia.gov.au/mygovguides**
- **servicesaustralia.gov.au/medicarecard**

## Medicare card

You will get a Medicare card in the mail when you are enrolled. We will send it to the address you give us. You can also get a digital copy of your Medicare card. You will need to sign into the Express Plus Medicare mobile app to access it.

For more information in English about the Express Plus Medicare mobile app, go to **servicesaustralia.gov.au/expressplusmedicare**

To use the apps, you need a myGov account linked to your Medicare online account. If you do not have these, set them up and then download the apps.

You need a valid Medicare card to:

- claim Medicare benefits
- visit a doctor who bulk bills
- get treated as a public patient in a public hospital
- get some medicines at a lower cost.

Your Medicare card can also help if you are a private patient getting treatment in a public or private hospital.

We can issue a maximum of 2 cards to a family. If you are 15 or older, you can get your own Medicare card.

If your Medicare card is lost or stolen, you can get a new one using your Medicare onlineaccount or the Express Plus Medicare mobile app.

For more information in English, go to **servicesaustralia.gov.au/medicarecard**

## Register your bank account details

Register your bank account details with us so we can pay your Medicare benefits directly into your nominated bank account.

Register your bank account details using:

- your Medicare online account through myGov
- the Express Plus Medicare mobile app.

You need to:

- have your Medicare card and bank account details (BSB, account number and account name) with you when you register
- let us know if your details change.

For more information in English, go to **servicesaustralia.gov.au/medicareservices**

## Claiming

You can claim for health care services for anyone listed on your Medicare card.

Staff at your doctor’s office can submit the claim on your behalf if they offer electronic claiming.If your doctor’s office cannot submit the claim on your behalf, you can submit a claim:

- using your Medicare online account through myGov
- using the Express Plus Medicare mobile app
- in person at a service centre
- via post by completing a Medicare Claim form (MS014).

You can also claim for someone on another Medicare card if you have paid for the service. You cannot do this online.

To find out more about claiming options in English, go to **servicesaustralia.gov.au/medicareclaiming**

## Reciprocal Health Care Agreements

Medicare does not cover treatment when you go overseas. However, the Australian Government has signed Reciprocal Health Care Agreements (RHCA) with some countries to cover Australians for the cost of essential medical treatment while they are visiting those countries.

Visitors from those countries may also be able to get some health services and cheaper medicines when they are in Australia.

To find out more about the RHCA in English, go to **servicesaustralia.gov.au/rhca**

## Medicare self service

It is easy to do business with us anytime and anywhere. You can do most things quickly and easily without needing to call or visit us.

Use your Medicare online account and Express Plus Medicare mobile app to make a claim, update your personal and bank details or request a replacement or duplicate Medicare card. You can also view immunisation statements and much more.

## Medicare online account

You can register for a Medicare online account through myGov. It is a secure way for you to doyour business with Medicare when and where it suits you.

To find out how to register in English, go to **servicesaustralia.gov.au/medicareonline**

## Express Plus Medicare mobile app

You can also do many things using the Express Plus Medicare mobile app. Once you have a Medicare online account, you can download the app from the App Store, Google Play or the Windows Store.

To find out more about the app in English, go to **servicesaustralia.gov.au/expressplus**

## For more information

- Go to **servicesaustralia.gov.au/medicareservices** for more information in English
- Go to **servicesaustralia.gov.au/yourlanguage** where you can read, listen to or watch information in your language
- Call **131 202** to speak with us in your language about Centrelink payments and services
- Call **132 011** for Medicare and **131 272** for Child Support. Let us know if you need aninterpreter, and we will arrange one for free
- Visit a service centre.

Note: calls from your home phone to '13' numbers from anywhere in Australia are charged at a fixed rate. That rate may vary from the price of a local call and may also vary between telephone service providers. Calls to '1800' numbers from your home phone are free. Calls from public and mobile phones may be timed and charged at a higher rate.

## Disclaimer

The information contained in this publication is intended only as a guide to payments and services. It is your responsibility to decide if you wish to apply for a payment and to make an application with regard to your particular circumstances.